# නෝර්ත්සී ලිමිටඩ්

## ධීවර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක සමාගමකි

# ඇබෑර්තු

පහත සදහන් තනතුරු පිරවීම සඳහා, සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුද්ගලයන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## සාමාන්‍යාධිකාරී

**අ) සුදුසුකම් හා පළපුරුද්ද**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් කළමනාකරණ / වාණිජ්‍ය / මානව සම්පත් / ඉංජිනේරු ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්,

   සමග

   අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි (මාස්ටර්ස්) සුදුසුකම් හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ, පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය,

   සහ

   සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක කළමනාකරණ තලයේ අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද.

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක, පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය,

   සහ

   සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක, "කළමනාකරණතලයේ" අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද.

**ආ) අදාළ වැටුප් කේත අංකය සහ මාසික වැටුප් පරිමාණය :**

HM 1-3 2016 - II ශ්‍රේණිය - 86,865-15X2,270-120,915/-

වැටුපට අමතරව, මාසික ඉන්ධන දීමනාව, නිල වාහන පහසුකම් හෝ මාසික ප්‍රවාහන දීමනාව රුපියල් 50,000/- සහ අනෙකුත් රජයේ අනුමත දීමනා.

**ඇ) වයස :** අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර, 55 ට නොවැඩි විය යුතුය. මෙම ඉහළ වයස් සීමාව, අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

## ගණකාධිකාරී

**අ) සුදුසුකම් හා පළපුරුද්ද**

ICASL / CIMA / ACCA ආයතනයක අන්තර් මධ්‍ය සුදුසුකම් හෝ පිළිගත් කළමනාකරණ / වාණිජ්‍ය ක්ෂේත්‍රයේ විශ්වවිද්‍යාල උපාධියක් හෝ HNDA හෝ කළමනාකරණ ක්ෂේත්‍රය.

ප්‍රථම උපාධිය හෝ සමාන සුදුසුකම් ලබා ගැනීමෙන් පසු, සංස්ථාවක / මණ්ඩලයක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක කළමනාකරණ තලයේ ගිණුම්කරණ හා මූල්‍ය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද.

**ආ) අභ්‍යන්තර අයදුම්කරුවන් :**

අයදුම්කරුවන් හට එම සුදුසුකම් තිබිය යුතු අතර, ක්ෂේත්‍රයට අදාළව කනිෂ්ඨ කළමනාකරු JM 1-1 වර්ගීකරණයේ තනතුරක අවම වශයෙන් වසර 5 ක සතුටුදායක සේවා පළපුරුද්දක් තිබිය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්හට වයස් සීමාව බලපාන්නේ නැත.

**ඇ) අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය :**

MM 1-1 2016 - II ශ්‍රේණිය - 53,175 - 10X1375 - 15X1910 - 95,575/-

(2020.01.01 දින සිට බලපැවැත්වේ.) සමග ජීවන වියදම් දීමනාව සහ රජයේ අනුමත අනෙකුත් දීමනා.

**ඈ) වයස :**

අවුරුදු 30 ට අඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

## පහත සඳහන් නිර්නයක, ඉහත තනතුරු සඳහා පොදු වශයෙන් අදාළ වේ.

**එ) වෙනත්**

සෑම අයදුම්කරුවකුම,

1) තනතුරට අදාළ රාජකාරි නිසි ලෙසට ඉටුකිරීමටත්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් හැකි වන පරිදි මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතුය.
2) මනා චරිතයකින් යුක්ත විය යුතුය.

- **පත් කිරීමේ ස්වභාවය**

  ඉහත තනතුරු ස්ථිර පදනමකින් වන අතර, වසර තුනක පරිවාස කාලයක් ඇතුළත්ය. සේවක අර්ථ සාධක හා සේවක භාර අරමුදල් සඳහා දායකත්වය හිමි අතර, සමාගමට අදාළව රජය විසින් අනුමත කළ දීමනා ගෙවනු ලැබේ.

## බඳවා ගැනීමේ ක්‍රමවේදය

සේවකයන් විසින්, කලින් කලට නියම කරනු ලබන, අදාළ ක්ෂේත්‍රයේ සාක්ෂරතා හා ප්‍රවීනතා ලබාගත යුතුවේ. සමාගමේ බඳවා ගැනීමේ යෝජනාක්‍රමයෙහි නියමිත තෝරා ගැනීමේ නිර්ණායක මත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන සුදුසුකම් අනුපිළිවෙල මත තෝරාගැනීම් සිදු කරනු ලැබේ.

අයදුම්කරුවන් විසින්, තම සම්පූර්ණ ජීවදත්ත හා ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ ඇමතුම් විස්තර ඇතුළත්ව සකස් කරන ලද අයදුම්පත්, අදාළ අධ්‍යාපනික / වෘත්තීය සුදුසුකම් හා පෙර පළපුරුද්ද සහතික සමග ඉදිරිපත් කළ යුතුය.

කරුණාකර, අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ, අයදුම් කරනු ලබන තනතුර සඳහන් කරන්න. අයදුම්පත්, ලියාපදිංචි තැපැලෙන්, 2020 සැප්තැම්බර් 08 දිනට පෙර, (මෙම දැන්වීම පළවී සති දෙකක් ඇතුළත), සභාපති, නෝර්ත්සී ලිමිටඩ්, අංක 450, ඩී.ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10 යන ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය.